සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 40 S II

පෙරදිග සංගීතය | කාලය පැය දෙකයි

⋆ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) අංක i සිට iv දක්වා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

i. බිලාවල් රාගයෙහි අනුවාදී ස්වර ලියන්න.
ii. නිරිග, රිග, පරි ආදී වශයෙන් ස්වර සංගති යෙදෙන රාගය නම් කරන්න.
iii. ලාවනී සහ ජප් තාලයෙහි දෙවන අනුතාලය පිහිටන්නේ කුමන මාත්‍රාව මතද?
iv. "කවුරුදෝ අර කවුළුවෙන්" යන ගීතය නිර්මාණය කර ඇත්තේ කුමන රාගයක් ආශ්‍රය කරගෙනද?

❖ අංක v සිට viii දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර ප්‍රශ්න අංකයද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

v. "අන්දර යායේ වැව් තාවුල්ලේ" යන පියගුණ ගීතය ගායනා කරනු ලබන්නේ ................................................ යන් විසිනි.
vi. ඉදිරියටා යමු සැවොමා, සිරි දරු හෙළදිව යන මනරම් ගී ඇතුළත් වනුයේ .................................... චිත්‍රපටයේය.
vii. ඇම්.ඇස්. ප්‍රනාන්දු සහ ඇන්ටන් ජෝන්ස් වැනි ගායකයින් ................................................ ගීත ශෛලියෙන් ගීත ගැයුවෝය.
viii. කොහිනූර්, බෛජුබව්රා, ජනක් ජනක් පායල් භාජේ ආදී හින්දි චිත්‍රපට හි සංගීතය .......................................... පසුබිමකින් යුක්ත සංගීත නිර්මාණයන් දැකිය හැකිය.

❖ ප්‍රශ්න අංක ix සහ x හි හිස්තැන් සඳහා සුදුසු පිළිතුර ප්‍රශ්න අංකයද සමඟින් ඔබේ පිළිතුර පත්‍රයෙහි ලියන්න.

ix. රාජ කපුරු නාට්‍යය ........................................... නිෂ්පාදනයක් වන අතර එහි ගැයෙන ............................................ යන ගීතය ජනප්‍රිය නාට්‍ය ගීයකි.

x. ජර්මනියේ "බොන්" නුවරදී උපත ලැබූ ............................................ ළමා වියේ දීම අති දක්ෂ පියානෝ වාදකයෙකි
.
ඔහු ........................., .................................. යන සංගීතඥයාගෙන් ද ශිල්ප හදාරා ඇත. (ලකුණු 12කි)

(02) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් විස්තර වේ.,

A- කල්‍යාණ මේලයෙන් උපදී
ධෛවතය සංවාදී ස්වරයයි.

B- කල්‍යාණ මේලයෙන් උපදී
නිශාදය සංවාදී ස්වරයයි.

C- මධ්‍යම රාත්‍රියෙහි ගැයීමට සුදුසුය.
ෂඩ්ජය සංවාදී වේ.

i. ඉහත A,B සහ C රාග පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 3කි)

ii. ඉහත රාග තුනට අදාළව ගන්ධාර ස්වරය වැදගත් වන අයුරු රාග නාමය ඉදිරියේ සඳහන් කරන්න. (ලකුණු 3කි)

iii. ඉහත රාග තුනෙන් පංචමය වාදී වන රාගයෙහි, මධ්‍යලය හෝ ලක්ෂණ ගීතයේ ස්ථායී කොටස නියමිත තාල සංඥා සමඟ ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 6කි)

(03) නිර්දේශිත රාග දෙකක ස්වර සංකේත නොමැතිව ස්වර සංගති දක්වා ඇත.

A - මග, සරිස, ධනිස B - ගරි, ගප, ධනිස

i. A සහ B යන රාග දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ඉහත ස්වර ඛණ්ඩ නිවැරදි ස්වර සංකේත සමඟින් නැවත ලියා දක්වන්න. (ලකුණු 02)

iii. ඉහත රාග දෙකෙන් එක් රාගයකට අදාළව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර 2 ක් ලියන්න. (1x2 ලකුණු 02)

iv. සඩ්ජය සංවාදී ස්වරය වන රාගයෙහි මධ්‍යලය හෝ ලක්ෂණ ගීතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

v. සුළු මැදුම් දෙතිතට සමාන හින්දුස්ථානි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. ( ලකුණු 02 )

(04) i. අනාඝාතාත්මක පැදි යන්න හඳුන්වන්න. ( ලකුණු 02 )

ii. විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණු ගී පිළිබඳව හඳුන්වා, එම කරුණු දෙක සඳහා සුවිශේෂ ගීත දෙකක් උදාහරණයට දක්වන්න. ( ලකුණු 04 )

iii. සබරගමු වන්නම් පිළිබඳ සුවිශේෂ කරුණු 4 ක් ලියා දක්වන්න. (ලකුණු 04 )

iv. ඔබ උගත් පහතරට වන්නමක කවියෙහි පළමු පාදය නියමිත තිත අනුව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 )

(05) i. නාඩගම් සංගීතයට අදාළව සුවිශේෂ කරුණු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04 )

ii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ගීතය | ආශ්‍රය කරගත් රාගය | තාලය |
|---|---|---|
| සවන් දී පෙර රාම චරිතේ අසව් | | |
| | කාෆි | |
| අප ගුණසරු සිංහල භූපති | | |

(ලකුණු 1/2x6 =3 )

iii. "සවන්දී පෙර රාම චරිතේ අසව්" යන ගී පාදය නියමිත තාලය අනුව පද ප්‍රස්තාර කරන්න. ( ලකුණු 02 )

iv. මනමේ, සිංහබාහු, කාලගෝල යන නව නාට්‍යයන්හි නිෂ්පාදකවරු, ගීත හා යොදාගත් සංගීත භාණ්ඩ පිළිබඳව තොරතුරු ඇතුළත් වගුවක් සකස් කරන්න. (ලකුණු 03 )

(06) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ස්වර ප්‍රස්තාර කරන්න. ( ලකුණු 03 )

ii. ඉහත ස්වර ප්‍රස්තාරයේ a,b,c,d වශයෙන් ලකුණු කර ඇති අපරදිග ස්වර සංකේත සඳහා භාවිත නාමයන් ලියන්න. (ලකුණු 02 )

iii. පෙරදිග ක්‍රමය අනුව ප්‍රස්තාර කරන ලද ප්‍රස්තාරයේ පළමු විභාග හතරට අයත් ස්වර, පංචම භාවයට පෙරළා නැවත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

iv. F major scale හා F minor scale පෙරදිග ක්‍රමය අනුව ලියා දක්වන්න. (ලකුණු 03)

(07) පහත සඳහන් මාතෘකා අතුරෙන් 3 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. කපිරිඤ්ඤා ගීත 2. සේ ගී 3. ඩබ්.බී. මකුලොලුව

4. ධ්වනි ගුණය 5. හරිප්‍රසාද් චෞරසියා (ලකුණු 4x3=12 )